සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/01

ඔබේ අංකය / உமது இல / Your No: ..................

දිනය / திகதி / Date: 2016/03/28

දිවිනැගුම බැංකු චක්‍ර ලේඛ අංක 2016 / 03

දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් වෙත,

## "අපේකම රැකගනිමු - සකසුරුවම ඇති කරමු."

## සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2016

### 01. හැඳින්වීම.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති විසින් සිංහල/ හින්දු අළුත් අවුරුද්ද, බැංකු ගණුදෙනුකරුවන් ඇතුළු සමස්ථ ජනතාව සමඟ උත්සවශ්‍රීයෙන් සැමරීමට සුදානම් කර ඇත.

ඒ අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකු ජාලය විසින් සිංහල/ හින්දු සිරිත් විරිත් හා ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින් " අපේකම රැකගමු - සකසුරුවම ඇති කරමු" තේමාව යටතේ වැඩසටහන් මාලාවක් දියත් කිරීමට සැලසුම් කර ඇත.

### 02. ක්‍රියාත්මක වැඩසටහන්

I. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන

II. දිවිනැගුම ප්‍රජාමූල බැංකු මඟින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.

### 03. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන

3.1. 2016 වර්ෂයේ සිංහල/ හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන්, ගණුදෙනු කිරීමේ චාරිත්‍රය මෙවරත් ඉතාමත් උත්සවශ්‍රීයෙන් සැමරීමට, දිවයින පුරා පිහිටි දිවිනැගුම ප්‍රජාමූල බැංකු සූදානම් කරමු. එම චාරිත්‍රය සඳහා සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු 2016.04.14 දින විවෘත කර, ගණුදෙනු කිරීම සිදු කල යුතුය.

3.2. අළුත් අවුරුද්ද සඳහා 2016.04.14 දින ප්‍රජාමූල බැංකු සමඟ ගණුදෙනු කරන, ගණුදෙනුකරුවන්ට සිංහල සිරිතට අනුව බුලත් කොලයක තබා රු.10.00 ක කාසියක් තුටු පඬුරක් ලෙස ලබාදීමට කටයුතු කළ යුතුය. එම තුටු පඬුර බැංකුවට පැමිණ මුදල් තැන්පත් කරන ගණුදෙනුකරුවන්ට පමණක් පිරිනැමිය යුතුය. එම කාර්යයට පෙර සූදානමක් ඇතිකර ගත යුතු අතර, අදාල වැයකරන සත්‍ය වියදම, වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර පොදු ලෙජරයේ සටහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax-011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
011-2887722(Hotline)
Isuri-desktop-Anura-Circular

3.3. 2016.04.14 දින දිවිනැගුම ප්‍රජාමූල බැංකු විවෘත කර ගණුදෙනු කිරීමට අමතරව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ද අප්‍රේල් මස 14වන දින සිට 20 දක්වා එම දෙදින ද ඇතුළත්ව සතියක් පුරාවට සියළුම ග්‍රාම නිලධාරී වසම් සිසාරා ක්‍රියාත්මක කෙරේ.

3.4. ඒ සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයට අයත් වසම්වල සේවය කරන සියළුම දිවිනැගුම නිලධාරීන්ට ඉලක්ක ලබාදෙන අතර, ඒ අනුව එක් වසමකට සියළුම ගිණුම් සඳහා තැන්පතු ලෙස රු.80,000 ක් හෝ ඊට වැඩි මුදලක් රැස් කිරීමට ඉලක්කයක් ලබාදිය යුතුය.

3.5. සිංහල/ හින්දු අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ දිවිනැගුම ප්‍රජාමූල බැංකුවක් දැනට ක්‍රියාත්මක සියළුම තැන්පතු සඳහා ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුල රු.මි.1.0 තැන්පතු මුදලක් රැස් කිරීම කල යුතුය. (ක්ෂේත්‍ර තැන්පතු ඉලක්කය ද ඇතුලත්ව)

3.6. මෙම ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුළ, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩල සාමාජිකයන් හා ප්‍රජාමූල සංවිධාන වල නිලධාරීන්ගේ සෘජු ලෙස දායකත්වය ලබාගත යුතුය.

3.7. ඉතුරුම් ප්‍රවර්ධන සතිය හා අළුත් අවුරුදු ගණුදෙනු සඳහා තැන්පත් කරන සියළුම තැන්පතු මුදල්, තැන්පත් කරන ලද දිනයේ සිට අවුරුදු 01ක් බැංකුවේ තැන්පතු ලෙස රඳවාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය.

3.8. 2016 සිංහල / හින්දු අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ගණුදෙනුකරුවන්ට තිළිණ ලබාදීම සිදුකරනු ලබයි. එහි දී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව සුදුසු ආයතනයක් / ආයතන තෝරා බැංකු වෙත ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එහි දී දිවයින පුරා සියලුම බැංකු වල ඒ ඒ තැන්පතු මුදල අනුව සුදුසු එකම වර්ගයේ තිළිණයක් හඳුන්වා දී එවන බවටත් තවදුරටත් දන්වමි. එබැවින් බැංකු විසින් ප්‍රසම්පාදන කටයුතු මඟින් මිලදී ගැනීම් සිදු නොකල යුතු බවට දන්වා සිටිමු.

**04.** **බැංකු කලාප මට්ටමින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.**

4.1. දිවයින පුරා පිහිටි සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු තම කලාපය තුළ එක් අවුරුදු උත්සවයක් සංවිධානය කර පැවැත්වීම අනිවාර්ය වේ.

4.2. අළුත් අවුරුදු උත්සවය 2016.04.24 ඉරිදා දින දවස පුරා පැවැත්වීමට කටයුතු කළ යුතුය. ඒ අනුව එකම දිනයක් තුළ අළුත් අවුරුදු උත්සව 1074 ක් පැවැත්වීමට යෝජිතය.

4.3. ඡේද අංක 4.2 හි සඳහන් පරිදි, විශේෂ හේතුවක් මත අවුරුදු උත්සවය පැවැත්වීමට නොහැකි වන විට පමණක් ඊලගට එළඹෙන සති අන්ත දිනයක් තෝරා ගත යුතුය. ඒ සඳහා පූර්ව අනුමැතිය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගෙන් ලබාගත යුතුය. ඒ පිළිබඳව ප්‍රජාමූල බැංකු අංශය දැනුවත් කිරීම අනිවාර්ය වේ. (අවුරුදු උත්සව වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ තොරතුරු

එවීමේ දී, අදාල දිනය වෙනස් කිරීම පිලිබද අනුමැතිය ලත් බවට සුවිශේෂ සටහනක් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තැබිය යුතුය. )

4.4. ජන ක්‍රීඩා වලට මුල්තැන දෙමින් බැංකු කටයුතු ප්‍රවර්ධනය වන අයුරින් අවුරුදු උත්සවය පැවැත්විය යුතුය.

4.5. දිවිනැගුම ප්‍රජාමූල බැංකු විසින් සංවිධානය කරන, බක්මහ උළෙල සඳහා අවශ්‍ය වියදම් පිරිමසාගැනීමට රු.40,000ක උපරිම මුදලක් වැය කිරීමට අවසර දෙන අතර, එම වියදමෙන් රු.15,000ක් ප්‍රජාමූල බැංකු අංශය මඟින් බැංකුවට ප්‍රතිපූර්ණය කරන අතර, වැය වන ඉතිරි මුදල බැංකු අරමුදලින් දරා ගත යුතුය. වියදම් දැරීමේ දී අදාල මුදල සඳහා පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කරගත යුතු අරමුදල් ගිණුම (ප්‍රජාමූල බැංකු අංශයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල)

හර - වැය ගිණුම උත්සව කටයුතු (බැංකුවෙන් දරන ලද මුදල)

බැර- ජංගම ගිණුම/ මුදල් ගිණුම

4.6. බැංකුවට ලබා දී ඇති තැන්පතු ඉලක්කය හෝ අවුරුදු උත්සවය පැවැත්වීමට නිශ්චිත දිනය යන කොන්දේසි සියල්ලම හෝ එකක් හෝ උල්ලංඝනය කරන, අනුගමනය නොකරන බැංකුවලට දිවිනැගුම ප්‍රජාමූල බැංකු අංශයෙන් ලබාදීමට නියමිත රු.15,000 ලබා නොදීමට තීරණය කර ඇති බැවින්, යම් හෙයකින් එවැනි අවස්ථාවක අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට තීරණය කර, පවත්වන අවස්ථාවක, ඒ සඳහා දැරීමට හැකි උපරිම මුදල රු.25,000 ක් බව අවධාරණය කරමු.

4.7.අවුරුදු උත්සවය පවත්වා මැයි මස 10ට පෙර ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල් සම්බන්ධ තොරතුරු, ආකෘති පත්‍ර 04 ට අනුව සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය. දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ ක්ෂුද්‍ර මූල්‍ය කළමනාකරු විසින්, දිස්ත්‍රික්කයේ සියළු බැංකුවලින් ඉල්ලීම් කරන ලද ප්‍රතිපූර්ණ මුදල් සම්බන්ධ වාර්තාව ඇමුණුම් 05 ට අනුව සකස් කර 2016 මැයි 31 දිනට පෙර ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම අනිවාර්ය වේ. ඉන් අනතුරුව කරන ඉල්ලීම් සම්බන්ධව ප්‍රතිපූණී මුදල් ලබාදීම සිදු නොකෙරේ.

4.8. අළුත් අවුරුදු උත්සවය සඳහා බාහිර සංවිධාන/ පාර්ශවල සහාය හා ආධාර ලබාගැනීමට හැකියාව ඇති අතර, ඒ සම්බන්ධ ලිපි ගොනු ක්‍රමවත් ලෙස නඩත්තු කිරීම කළ යුතුය.

## 05. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියේ කාර්ය භාරය

5.1. ජාතික හා දිස්ත්‍රික් ඉලක්ක කරා වැඩසටහන ඉදිරියට ගෙන යාමට සහාය ලබාදෙමින් බැංකු සමිති ඉලක්කය සපුරාගැනීමට කටයුතු කළ යුතුය. (ඔබ බැංකු සමිති බල ප්‍රදේශයේ සියළු බැංකුවල ඉලක්ක එකතු කර බැංකු සමිති ඉලක්කය සකස් කර ගත යුතුය.) එහිදී, ඉලක්ක සපුරා ගන්නා බැංකු සමිති දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමේ ඇගයීමකට ලක් කිරීමට කටයුතු කරනු ලැබේ.

5.2. බැංකු සමිති බල ප්‍රදේශයට අයත් සියළුම බැංකුවල අවුරුදු ගණුදෙනු වෙනුවෙන් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන හා අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට බැංකු සමිති කළමනාකරුගේ මග පෙන්වීම හා අධීක්ෂණය ලබාදිය යුතුය.

5.3. වැඩසටහන් වල ප්‍රගතිය දී ඇති උපදෙස් පරිදි දිස්ත්‍රික් දිවිනැගුම අංශයට යොමු කළ යුතුය.

5.4. අළුත් අවුරුදු උත්සවය සඳහා විධායක කමිටු සාමාජිකයන්ගේ දායකත්වය ලබාදීම හා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම ප්‍රජා සංවිධාන හරහා සිදු කළ යුතුය.

## 06. දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ කාර්ය භාර්ය

6.1. දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව අදාල වැඩසටහන සාර්ථකව සංවිධානය කර ඉලක්ක සපුරාගැනීමට දැනුවත් කළ යුතුය.

6.2. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ බැංකුවකට ලබාදී ඇති ඉලක්කය හා දිස්ත්‍රික්කය සියළුම බැංකු ගණන අනුව දිස්ත්‍රික්කයේ ඉලක්කය සකස් කරගැනීම.

6.3. අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට නියමිත දිනය හැර වෙනත් දිනයක් තෝරා ගැනීමට කරන ඉල්ලීම් වලදී ඔබගේ අනුමැතිය ලබාදීමට පෙර ඒ පිළිබඳ සුවිශේෂ තත්වයක් මත හා පිළිගත හැකි හේතුවක් ඇත්නම් පමණක් අනුමැතිය ලබාදීම හා ඒ පිළිබඳව ප්‍රජාමූල බැංකු අංශය දැනුවත් කිරීම.

6.4. දිස්ත්‍රික්කයේ ප්‍රජාමූල බැංකු විසින් අවුරුදු උත්සවය පවත්වන ස්ථානය පිලිබඳව තොරතුරු 2016.04.19 දිනට පෙර බැංකු මූල්‍ය අංශය වෙත දැනුම් දිය යුතුය.

6.5. අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු උත්සවය සඳහා දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ලබාදීම.

6.6. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, ඉලක්ක සපුරාගත් හා ඉහලම තැන්පතු එකතු කල නිලධාරීන් ඇගයීම් කිරීම.

6.7. ප්‍රගති වාර්තා නිසි පරිදි ලබාගෙන ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම.

6.8. ජාතික මට්ටමේ ඇගැයීම් උළෙලකදී ලබා දී ඇති ඉලක්කය සපුරා ගන්නා දිස්ත්‍රික් දිවිනැගුම අංශය ද ඇගැයීමකට ලක් කිරීමට කටයුතු කරනු ලැබේ.

**07. ප්‍රගති වාර්තා හා ප්‍රතිපූර්ණ මුදල් ඉල්ලුම් කිරීම.**

7.1

| වාර්තාව ලබාදිය යුතු බැංකුව/ අංශය | වාර්තාව යොමු කල යුතු දිනය | වගකීම දරන නිලධාරියා | වාර්තාව ගොනු කල යුතු බැංකුව/ අංශය | වාර්තාව එවීමට භාවිතා කල යුතු ආකෘතිය |
|---|---|---|---|---|
| <u>ඉතුරුම් රැස් කිරීම් ප්‍රගතිය</u> | | | | |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | 2016.04.27 | බැංකු කළමණාකරු | දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය | ඇමුණුම 01<br>ඇමුණුම 06 |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය | 2016.05.05 | බැංකු සමිති කළමණාකරු | දිවිනැගුම දිස්ත්‍රික් අංශය | ඇමුණුම 02<br>ඇමුණුම 06 |
| දිවිනැගුම දිස්ත්‍රික් අංශය | 2016.05.18 | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | ප්‍රජාමූල බැංකු අංශය | ඇමුණුම 03<br>ඇමුණුම 06 |
| <u>අළුත් අවුරුදු වියදම් ප්‍රතිපූර්ණය ඉල්ලීම.</u> | | | | |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | 2016.05.10 | බැංකු කළමණාකරු | දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය | ඇමුණුම 04 |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය | 2016.05.17 | බැංකු සමිති කළමණාකරු | දිස්ත්‍රික් දිවිනැගුම අංශය | ඇමුණුම 04 |
| දිස්ත්‍රික් දිවිනැගුම අංශය | 2016.05.31 | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | ප්‍රජාමූල බැංකු අංශය | ඇමුණුම 05 |

7.2. අළුත් අවුරුදු උත්සව වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා 2016.05.31 දක්වා කාලය ලබාදී ඇත. ඉන් අනතුරුව ප්‍රජාමූල බැංකු අංශයට ලැබෙන ඉල්ලීම සඳහා මුදල් ලබාදීම සිදු නොකෙරේ.

**08. නිලධාරීන් ඇගයීම හා ප්‍රශංසා සහතික ලබාදීම.**

8.1. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති විසින් බැංකු බල ප්‍රදේශයේ වසම් සඳහා දී ඇති ඉලක්කය හෝ ඉක්මවා වැඩිම තැන්පතු මුදලක් රැස්කරන ලද නිලධාරීන් 10දෙනා තෝරාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ මඟ පෙන්වීම යටතේ ප්‍රශංසා සහතික ලබාදීම. තවද, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඉහල තැන්පතු මුදලක් රැස්කරන බැංකු කළමණාකරු ඇතුළු කාර්යය මණ්ඩල ඇගයීමකට ලක්කර ප්‍රශංසා සහතික ලබාදිම.

8.2. ප්‍රජාමූල බැංකු සමිති විසින් ඇගයීම් වැඩසටහන සංවිධානය කිරීමට රු.5,000 ක් නොඉක්මවූ මුදලක් බැංකු සමිති අරමුදලින් වැය කිරීමට අවසර ඇත. වැයවන මුදල වැය ගිණුම - උත්සව කටයුතු වියදම් ගිණුමට හර කළ යුතුය.

8.3. දිස්ත්‍රික් දිවිනැගුම අංශය, ඉලක්ක සපුරා ගෙන ඉහළම තැන්පතු මුදලක් රැස්කර ඇති දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති 03 සඳහා, බැංකු සමිති කළමනාකරු/ බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රශංසා සහතික ලබාදිය යුතුය.

8.4. දිස්ත්‍රික්ක මට්ටමින්, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, ඉහලම තැන්පතු මුදලක් රැස්කරන හා ඒ සඳහා ඉහලම කැපවීම් කරන ලද බැංකු/ ක්ෂේත්‍ර නිලධාරීන් ඇගයීමකට ලක් කල යුතුය. ඒ ඒ දිස්ත්‍රික්කවල බැංකු සංඛ්‍යාව හා ක්ෂේත්‍ර වසම් ගණන වෙනස් බැවින්, ඇගයීමකට ලක්කල යුතු ක්ෂේත්‍ර නිලධාරීන් හා බැංකු සංඛ්‍යාව පහත වගුවේ සඳහන් පරිදි ඇගයීමකට ලක්කල යුතුය. තවද ඇගයීම් උළෙල සංවිධානය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන් ද පහත පරිදි, දිවිනැගුම ප්‍රජාමූල බැංකු අංශයෙන් ලබාදෙනු ලැබේ.

| **දිස්ත්‍රික්කයේ පිහිටි බැංකු සංඛ්‍යාව** | **ඇගයීමකට ලක්කල යුතු** | | **ලබාදෙන මුදල (රු)** |
|---|---|---|---|
| | **ක්ෂේත්‍ර නිලධාරීන් ගණන** | **බැංකු ගණන** | |
| 50ට අඩු | 10 | 10 | 50,000 |
| 51 – 100අඩු | 12 | 12 | 75,000 |
| 101 ට වැඩි | 15 | 15 | 100,000 |

8.5. 2016 සිංහල/ හින්දු අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධනය සඳහා ඉතුරුම් රැස් කිරීමට ලබා දී ඇති ඉලක්ක සපුරා ගැනීමට දිවිනැගුම සහනාධාර මුදල් හෝ වෙනත් දීමනාවලින් යම් කොටසක් ඉතුරුම් ලෙස තැන්පත් කරන ලෙස සහනාධාරලාභීන්ට හෝ ප්‍රතිලාභීන්ට බලපෑමක් සිදු කර ඇති බවට සනාථ වන ක්ෂේත්‍ර නිලධාරීන් හා බැංකු ඇගයීම් කාර්යයෙන් සම්පූර්ණයෙන් ඉවත් කල යුතුය.

**09. 2016.04.14 දින විශේෂිත රාජකාරියක නිරත වන බැවින්, බැංකු කාර්ය මණ්ඩලයට පමණක් එදින දිනක වැටුපක් ලබාගැනීමට අනුමැතිය ලබාදෙන්නෙමු.**

**10.** **විශේෂ කරුණු**

10.1. ඉතුරුම් සතිය තුල ක්ෂේත්‍ර නිලධාරීන් රැස්කරන තැන්පතු මුදල්, 2016.04.22 දිනට පෙර බැංකුව වෙත භාරදිය යුතුය. ඉන් අනතුරුව බැංකුගත කරන ලද මුදල් ඉලක්ක හා ඇගයීම් කටයුතු සඳහා සුදුසුකම් නොලබයි.

10.2.2016 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉතුරුම් ගිණුම් සඳහා වර්ගීකරණයක් නොමැතිව දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල ක්‍රියාත්මක සියළුම තැන්පතු ගිණුම්වලට තැන්පතු රැස්කිරීම කළ යුතුය.

10.3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, සියළුම බැංකු ගණුදෙනුකරුවන්ට පැමිණ, ගණුදෙනු කිරීමට ආරාධනා කිරීමට කටයුතු කල යුතුය. කිසිදු අයුරකින් චක්‍රලේඛ උපදෙස් වල සඳහන් ඉලක්ක සපුරා ගැනීමට ගණුදෙනුකරුවන්ට බලපෑම් නොකරන ලෙසත් පෙර වර්ෂවලදී මෙන්ම සුහදශීලිව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ වැදගත්කම මතක් කර දෙමින් මෙම වැදගත් මොහොතට සහ සම්බන්ධතාවය ඉහලින්ම ලබා ගැනීමට මතක් කර සිටිමු.

**චන්ද්‍රා වික්‍රමසිංහ,**
**අධ්‍යක්ෂ ජනරාල්**

**ඩී.ඒ.සුනන්දා පියසීලි,**
**අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)**

**පිටපත් :-**

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ස.
02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.ස.
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ස.
04. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස